 ISSN 2362-0412

# ශ්‍රී ලංකාවේ ධීවර ගමක පශ්චාත් සුනාමි සමාජ ස්තරායනය ගොඩ නැගෙන ආකාරය සහ ඊට බලපාන සාධක පිළිබඳ සමාජවිද්‍යාත්මක අධ්‍යයනයක්

එස්. එස්. තේනබදු
සමාජ විද්‍යා අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය

## සංක්ෂේපය

සමාජ විද්‍යාවේ ආරම්භය සහ විකාශනය සමඟ සමාජ අසමානතා හැදෑරීම සඳහා සමාජ ස්තරායනය යන පදය භාවිතයට එක් විය. සමාජයක අසමානතාවල ස්වභාවය, හේතු සහ ප්‍රතිඵල විග්‍රහ කිරීම සමාජ ස්තරායනය මගින් සිදු කෙරේ. සමාජ ස්තරායනය පිළිබඳ ඉදිරිපත් වී ඇති න්‍යායන් මෙන් ම ඒ සම්බන්ධයෙන් සිදු කර ඇති අධ්‍යයන තුළින් ද හෙළි වන්නේ සමාජ ස්තරායනය ගොඩනැගීම කෙරෙහි බලපාන්නා වූ හේතූන් පිළිබඳ ව පොදු එකඟතාවකට වඩා විවිධත්වයක් පවතින බව යි. මේ සන්දර්භය තුළ ඒ ඒ සමාජයන්හි සමාජ ස්තරායනය ගොඩනැගීම කෙරෙහි බලපාන සාධක අධ්‍යයනය කිරීම සඳහා සමාජ විද්‍යාත්මක වටිනාකමක් ඇති බව පැහැදිලි වේ.

සුනාමි ව්‍යසනයත් සමග ග්‍රාමීය ධීවර සමාජයන්හි පැවති සමාජ ස්තරායනය බිඳ වැටුණ අතර එය අළුතින් සකස් වීමට වසර 7-8 ක කාලයක් ගත විය. ඒ අනුව සුනාමියෙන් පසුව ග්‍රාමීය ධීවර ප්‍රජාව තුළ සමාජ ස්තරායනය ගොඩනැගෙන ආකාරය සහ ඒ කෙරෙහි බලපාන විවිධ සාධක මොනවා දැ යි විමසා බැලීම මේ පර්යේෂණ ගැටලුව මඟින් අවධානයට ලක් විය. සමාජයක ස්තරායනය සකස් වීම කෙරෙහි බලපාන්නේ ආර්ථික සාධක පමණක් ද නැතහොත් සමාජීය සහ දේශපාලනික ආදී විවිධ සාධක බලපාන්නේ ද යන්න තේරුම් ගැනීම එහි දී මුඛ්‍ය විය.

මාවැල්ල ධීවර ගම්මානය මෙම පර්යේෂණයේ අධ්‍යයන ප්‍රදේශයයි. මේ ගම 2004 දෙසැම්බර් 26 වන දින සුනාමි ව්‍යසනයෙන් බරපතල හානි සිදු වූ ගමක් විය. මෙම අධ්‍යයනයේ ක්‍රමවේදය ලෙස මානව විද්‍යාත්මක අධ්‍යයනවල දී සුලභ ව යොදාගනු ලබන ක්ෂේත්‍ර අධ්‍යයන සැලැස්ම මෙම අධ්‍යයනයට ගැලපෙන පරිදි යොදා ගැනුණි. දත්ත රැස් කිරීමේ දී ප්‍රශ්න මාලාව, නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා, වක්කම් පෙළගැස්ම සහ ද්විතීයික මූලාශ්‍රය යන මෙවලම් යොදාගනු ලැබී ය. අධ්‍යයනයේ අනාවරණ ලෙස අදාළ ග්‍රාමීය ධීවර ප්‍රජාව තුළ සමාජ ස්තර පහක් හඳුනාගත හැකි විය. ඒවා නම් ඇති - හැකි ස්තරය, ඇති නොහැකි ස්තරය, හැකි ස්තරය, නැති - හැකි ස්තරය, නැති - නොහැකි ස්තරය වේ. යට කී සමාජ ස්තරායන සකස් වීම කෙරෙහි ආර්ථික සාධක පමණක් නොව සමාජ ගරුත්වය සහ බලය වැදගත් වී ඇති බව නිගමනය කළ හැකි විය. බලය යටතේ පුද්ගල හෝ සාමූහික ප්‍රචණ්ඩත්වය හා දේශපාලන බලය ද වැදගත් වී ඇති බව අධ්‍යයනයේ නිගමන අතර කැපී පෙනේ.

*ප්‍රමුඛපද : සුනාමිය, ග්‍රාමීය ප්‍රජාව, සමාජ ස්තරායනය, සමාජ අසමානතාව, ක්ෂේත්‍ර අධ්‍යයන සැළැස්ම*